43568

OL/2015/50-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංග කලාව I, II | | පැය තුනයි |
| நாடகமும் அரங்கியலும் I, II | | மூன்று மணித்தியாலம் |
| Drama and Theatre I, II | | Three hours |

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ආශ්‍රයෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ගව සම්පත් බෝ වේවා - ගහ කොළ පලදා වේවා
ගජ කුළු බය නැති වේවා - ගණ දෙවි නුවණක් දේවා

(ii) නමින් පසිඳු දඹදිව් තල පඬිපුර රජ කළ    නිරිඳුට
යොදුන් ගණින් අඹ උයනක් විය එහි මැද සැදුණු    යසට
ඇසින් බලා බැරි නිමවනු රන් කඳ වෙයි ගහේ    පාට
ගොසින් පතිනි එඅඹ ගහේ අඹයක පිළිසිඳ එම    වීට

(iii) වනේ ගොසින් අපි නයි    අල්ලන්නේ
විනේ යෙදෙයි දවසක ඇන    ගන්නේ
අනේ කවුද මේ ගතුව    කියන්නේ
දණේ කාපි මගේ නයා    බොලන්නේ

(iv) **ගැහැණු වෙස් ගත් ඇදුරා** : ගුරුන්නාන්සේ, හේනක් කොටලා කපු ඇට ඉහළ ඒවායින් පැළයක් ඇවිල්ලා හඳක් පෑව්වා වගේ ලස්සනට බබළන මලක් පිපිලා තියෙනවා. දැන් ඉතින් මොකද කරන්න ඕන.

**ගුරුන්නාන්සේ** : කපු නෙළා ගන්න ඕන.

**ගැහැණු වෙස් ගත් ඇදුරා** : ඔව් ඔව් උඩු ගුවනේ ඉඳගෙන කපු නෙළන්න ඕන.

**1.** රට යකුමේ ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**2.** කොහොඹා කංකාරිය ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**3.** ගම්මඩු ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**4.** සොකරි ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

- නිවැරදි වරණය තෝරන්න.

**5.** නෘත්ත කණ්ඩායමට අයත් වන්නේ,
(1) භරත නාට්‍යම්හි රාධා-ක්‍රිෂ්ණා හා ශිව-පාර්වතී ය.
(2) ශුද්ධ මාත්‍රා, ලී කෙළි හා තෙල්මේ ය.
(3) ඔපෙරා, මුද්‍රා නාට්‍ය හා සංගීත ප්‍රසංග ය.
(4) මණිපුරි, යක්ෂගාන හා කථක් ය.

**6.** නාට්‍ය පෙළ රංගනයක් බවට පත් කිරීමේ දී පුරෝගාමී වන්නේ,
(1) ආනුෂංගික ශිල්පීන්ගේ කාර්යභාරයයි.
(2) නිෂ්පාදකගේ කාර්යභාරයයි.
(3) අධ්‍යක්ෂකගේ කාර්යභාරයයි.
(4) වේදිකා පාලකගේ කාර්යභාරයයි.

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

7. තම රූපණය වේදිකාවේ දී ඉතා හොඳින් සිදු වූ බවට නළුවාට සතුටට පත් විය හැක්කේ,
   (1) අධ්‍යක්ෂකවරයා ඉන් සෑහිමට පත් වූ විටයි.
   (2) රූපණ ශිල්පියාට තම රූපණය පිළිබඳ ව වැටහීයාමෙනි.
   (3) නළුවා පෙර පුහුණුව ලද වාර ගණන මත ය.
   (4) ප්‍රේක්ෂක ප්‍රතිචාරයේ ධනාත්මකභාවය මත ය.

8. වේෂභූෂණ ශිල්පියාගේ වගකීම
   (1) අඩු වියදම් මත අධ්‍යක්ෂකවරයාට දායක වීමයි.
   (2) චිත්තාකර්ෂණීය ලෙස ප්‍රේක්ෂකයා බැඳගැනීමට දායක වීමයි.
   (3) වේදිකා මායාව ප්‍රබල කිරීමට දායක වීමයි.
   (4) රංග රචනය ප්‍රබල කිරීමට දායක වීමයි.

9. අංග රචනයේ අරමුණකි,
   (1) වේදිකාව අඳුරු කළ පසු චරිත ප්‍රබල ලෙස ඉස්මතු කිරීම.
   (2) දුර සිටින ප්‍රේක්ෂකයාට වෙහෙසට පත් නො වී නැරඹීමට හැකි වීම.
   (3) රූපණ ශිල්පියා ගේ අලංකාර බව ඉස්මතු කිරීම.
   (4) ආලෝක ශිල්පියා ගේ රංගාලෝකයට දායක වීම.

10. ආලෝක ලපයක් ලොකු හෝ කුඩා කර වේදිකාව මතට පතිත කිරීමට උපකාරී වන්නේ,
   (1) ස්පොට් පහන (ලාම්පුව) ය. (2) ස්ට්‍රිප් පහන ය.
   (3) ෆ්ලඩ් පහන ය. (4) වර්ණ පහන ය.

11. වේදිකා නාට්‍යයක් රංගගත කරන මොහොත වන විට ප්‍රධාන නළුවා රෝගාතුර වුවහොත්
   (1) නාට්‍ය දර්ශනය අවලංගු කර ප්‍රවේශ පත්‍ර මුදල් ආපසු දිය යුතු ය.
   (2) වෙනත් රූපණ ශිල්පියකු ලවා එම භූමිකාව කළ යුතු ය.
   (3) අධ්‍යක්ෂවරයා ප්‍රධාන චරිතය ඉවත් කර සෙසු චරිත ප්‍රබල ව ඉදිරිපත් කළ යුතු ය.
   (4) ප්‍රධාන චරිතයේ හඬ පමණක් වේදිකාව තුළ ඉදිරිපත් කළ යුතු ය.

12. සිංහල හා ඉංග්‍රීසි වේදිකාව තුළ වඩාත් ප්‍රකට රංග වින්‍යාසකරුවෙකි,
   (1) ඉන්දු ධර්මසේන. (2) රුවන්ති ද චිකේරා.
   (3) ජෙරම් ලක්ෂ්මන් ද සිල්වා. (4) එච්. සී. පී. ලුඩොවයික්.

13. රංග රචනයේ දී සැලකිය යුතු වන්නේ,
   (1) ප්‍රධාන චරිත වේදිකාවේ ස්ථානගත කිරීමේ දී චලන රටා හඳුනාගැනීමයි.
   (2) මැද වේදිකාව හා තිර සැලකිල්ලට ගෙන චරිත ප්‍රබල ලෙස මතු කිරීමයි.
   (3) ඉහළ මැද වේදිකාව තුළ කණ්ඩායම් ලෙස නළු-නිළියන් සිටීමට සැලසීමයි.
   (4) වේදිකාව සැලකිල්ලට ගෙන චලන හා ඉරියව් පිළිබඳ අවබෝධය ගැනයි.

14. වර්තමානයේ නිපැදැවෙන බොහෝ වේදිකා නාට්‍යවලට වඩා ඇතැම් පැරණි නාට්‍ය නැරඹීමට අදටත් ප්‍රේක්ෂකයා වැඩිපුර කැමැත්තක් දක්වන්නේ,
   (1) වර්තමාන නාට්‍යවල ගැටුම ප්‍රබල නොවන නිසා ය.
   (2) අර්ථය ප්‍රබල ලෙස ග්‍රහණය කළ හැකි නිසා ය.
   (3) නාට්‍යයේ ප්‍රබල වන්නේ රසය නිසා ය.
   (4) නාට්‍යධර්මී සම්ප්‍රදාය වින්දනයට පහසු නිසා ය.

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක **15** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| ද ඩ්‍රැගන් | එව්ගිනි ෂ්වාට්ස් | මකරාක්ෂයා | ක |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසී විලියම්ස් | ග | හෙන්රි ජයසේන |
| සික්ස් කැරැක්ටර්ස් ඉන් සර්ච් ඔෆ් ඇන් ඔතර් | ලුයිජි පිරැන්ඩලෝ | හරිම බඩු හයක් | ජ |
| ට | සොෆොක්ලීස් | බෙරහඬ | බන්දුල ජයවර්ධන |
| අ ස්ට්‍රීට් කා නේම්ඩ් ඩිසයර් | ඩ | වෙස් මුහුණු | ධම්ම ජාගොඩ |

15. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු මෙරට අධ්‍යක්ෂකගේ නම කුමක් ද?
   (1) විජිත ගුණරත්න (2) ධර්මසිරි බණ්ඩාරනායක
   (3) සුගතපාල ද සිල්වා (4) රංජිත් ධර්මකීර්ති

[ තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**16.** ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) අහස් මාළිගා (2) වීදුරු බඳුන් (3) සුබ සැන්දෑවක් (4) පළිඟු බෝනික්කෝ

**17.** ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක වන්නේ,
(1) හෙන්රි ජයසේන ය. (2) සුගතපාල ද සිල්වා ය. (3) එදිරිවීර සරච්චන්ද්‍ර ය. (4) ජයලත් මනෝරත්න ය.

**18.** ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) මීඩියා (2) යෙර්මා (3) ඉක්නෙව්ටාඉ (4) ද මැරේජ්

**19.** ඉහත වගුවේ 'ඩ' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක් ද?
(1) ආතර් මිලර් (2) ඇන්ටන් චෙකොෆ් (3) බර්ටෝල්ට් බ්‍රෙහ්ට් (4) ටෙනසී විලියම්ස්

**20.** පහත දැක්වෙන ළමා නාට්‍ය අතුරෙන් වැඩිහිටියන් විසින් රඟපාන ලද ළමා නාට්‍යය වන්නේ,
(1) හිම කුමරී ය. (2) ටිකිරි මැණිකේ ය. (3) තොප්පි වෙළෙන්දා ය. (4) පුංචි සුරංගනාවී ය.

**21.** හිම කන්ද දියවීමේ අභ්‍යාසය
(1) ශිථිලීකරණ අභ්‍යාසයකි. (2) ශ්වසන අභ්‍යාසයකි.
(3) තාපන අභ්‍යාසයකි. (4) සංවේදන අභ්‍යාසයකි.

**22.** වර්තමානයේ ලොව ප්‍රකට අභිරූපණ ශිල්පියා වන්නේ,
(1) ඒටියනේ දෙක්රොක්ස් ය. (2) මාෂල් මාෂොව් ය.
(3) මෙයර්හෝල්ඩ් ය. (4) ස්ටැනිස්ලාව්ස්කි ය.

**23.** රබන් පද සහ සවුදම් ඇසුරෙන් නාදමාලා සකස් කර නාට්‍ය අධ්‍යක්ෂණය කළේ,
(1) චිත්‍රසේන ය. (2) ප්‍රේම රංජිත් තිලකරත්න ය.
(3) දයානන්ද ගුණවර්ධන ය. (4) ගුණසේන ගලප්පත්ති ය.

● පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **24** සිට **29** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ

**24.** මෙහි '**ක**' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,
(1) පරාක්‍රම නිරිඇල්ල ය. (2) දයානන්ද ගුණවර්ධන ය.
(3) ගුණසේන ගලප්පත්ති ය. (4) සුගතපාල ද සිල්වා ය.

**25.** මෙහි '**ග**' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,
(1) රංජිත් ධර්මකීර්ති ය. (2) ගුණසේන ගලප්පත්ති ය.
(3) සයිමන් නවගත්තේගම ය. (4) ධර්මසිරි බණ්ඩාරනායක ය.

**26.** මෙහි '**ජ**' ඡායාරූපයෙන් දැක්වෙන රූපණ ශිල්පිනිය වන්නේ,
(1) සෝමලතා සුබසිංහ ය. (2) සන්ධ්‍යා කුමාරි ය. (3) මානෙල් ජයසේන ය. (4) රුක්මණී දේවි ය.

**27.** ක්ෂණික නිරූපණය යනු,
(1) ක්ෂණික ව සකසා ගත් පිටපතක් මත ඉදිරිපත් කරන්නකි.
(2) නිර්මාණාත්මක චින්තනය හා හැකියාව මත වේදිකාවේ ඉදිරිපත් කරනු ලබන්නකි.
(3) පිටපතකින් තොරව සීමිත කාලයක දී යම්කිසි අවස්ථාවක් නිරූපණය කරන්නකි.
(4) නිර්මාණාත්මක චින්තනය හා හැකියාව ඇති පාසල් සිසුන් විසින් ඉදිරිපත් කරනු ලැබීමකි.

**28.** රූපණ ශිල්පියකුට දෑස්වල සබඳතාව පවත්වාගැනීම ඉතා වැදගත් ය. මේ සඳහා ප්‍රගුණ කළ යුතු අභ්‍යාසයකි,
(1) ශිථිලීකරණ අභ්‍යාසය. (2) සංවේදන අභ්‍යාසය. (3) තාපන අභ්‍යාසය. (4) දර්පණ අභ්‍යාසය.

**29.** ස්ටැනිස්ලාව්ස්කි,
(1) රූපණවේදය හඳුන්වා දුන් තැනැත්තෙකි. (2) ඇමරිකාවේ ප්‍රසිද්ධියට පත් නළුවෙකි.
(3) ප්‍රකට රූපවාහිනී සහ චිත්‍රපට නළුවෙකි. (4) නාට්‍යධර්මී ශෛලිය බටහිරට හඳුන්වා දුන් තැනැත්තෙකි.

**30.** වඩාත් නිවැරදි වරණය තෝරන්න.
මුද්‍රා නාට්‍යයක,
(1) සංගීතය හා රංගාලෝකය ප්‍රබල වේ.
(2) ආංගික හා වාචික අභිනය ප්‍රබල වේ.
(3) හස්ත මුද්‍රා භාවිතය ප්‍රධාන වේ.
(4) කතාවක් හෝ අදහසකට වඩා ප්‍රකාශනයක් නිරූපණය කෙරේ.

[ හතරවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

43568

**31.** වඩාත් නිවැරදි වරණය තෝරන්න.
(1) බැලේ සහ මුද්‍රා නාට්‍යය යනු එක ම කලා ප්‍රභේදයකි.
(2) ඔපෙරාව සහ බැලේ යනු එක ම වර්ගයකට අයත් නාට්‍ය ය.
(3) රංග රටා බැලේවල දී ප්‍රධාන වේ.
(4) 'හංසවිල' ඔපෙරා හා බැලේ යන වර්ග දෙකට ම අයත් ය.

● පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග

**32.** මෙහි දැක්වෙන වෙස් මුහුණු දෙකින්,
(1) 'ක' සන්නි මුහුණකි, 'ග' කෝලම් මුහුණකි.
(2) 'ක' හා 'ග' කෝලම් මුහුණු දෙකකි.
(3) 'ක' කෝලම් මුහුණකි 'ග' සන්නි මුහුණකි.
(4) 'ක' හා 'ග' සන්නි මුහුණු දෙකකි.

**33.** මෙම වෙස් මුහුණු දෙක,
(1) 'ක' මූර්තු සන්නිය හා 'ග' ආරච්චි කෝලම වේ.
(2) 'ක' ආරච්චි කෝලම හා 'ග' කණ සන්නිය වේ.
(3) 'ක' ආරච්චි කෝලම හා 'ග' පොලිස් කෝලම වේ.
(4) 'ක' මූර්තු සන්නිය හා 'ග' කණ සන්නිය වේ.

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් **34** සිට **38** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට | ඩ |
|---|---|---|---|---|
| පූර්ව රංගය | සේපාලිකා | ගබඩා කොල්ලය | වඳ බිසව් | පාලඟ |
| මද්දලය | ගුණතිලක | වෙස් මුහුණ | කපු නෙළීම | පත්තිනි |

**34.** ඉහත වගුවේ 'ක' කාණ්ඩයෙන් දැක්වෙන්නේ,
(1) සොකරි ය. (2) නාඩගම් ය. (3) කෝලම් ය. (4) නූර්ති ය.

**35.** ඉහත වගුවේ ප්‍රධාන චරිත දෙක අයත් නාට්‍යය,
(1) මඟුල් ප්‍රස්ථාව ය. (2) වෙල්ලවැහුං ය. (3) කපුවා කපෝති ය. (4) පුස්ලෝඩං ය.

**36.** ඉහත වගුවේ 'ජ' කාණ්ඩය අයත් වන්නේ,
(1) මඩු ශාන්තිකර්මයට ය.
(2) රටයකුමට ය.
(3) සූනියම් යාගයට ය.
(4) කොහොඹා කංකාරියට ය.

**37.** ඉහත වගුවේ 'ට' කාණ්ඩය අයත් වන්නේ,
(1) සූනියම් යාගයට ය.
(2) රටයකුමට ය.
(3) කොහොඹා කංකාරියට ය.
(4) සන්නියකුමට ය.

**38.** ඉහත වගුවේ 'ඩ' කාණ්ඩයෙහි සඳහන් චරිත,
(1) මඩු ශාන්තිකර්මයට අයත් ය.
(2) රිද්දි යාගයට අයත් ය.
(3) දොරකඩ අස්නට අයත් ය.
(4) වඩිග පටුනට අයත් ය.

**39.** නිවැරදි පිළිතුර තෝරන්න.
පින්තූර රාමු වේදිකාවේ කල්පිත බෙදීම් කොටස් කීය ද?
(1) හතර ය. (2) නවය ය. (3) හය ය. (4) අට ය.

**40.** රූකඩ නටවන ශිල්පියා,
(1) පොතේගුරු ය. (2) අන්නවිරාළ ය. (3) සූත්‍රධාර ය. (4) සබේ විදානේ ය.

* *



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**හේතු** : මට යන්න බෑ ලොකු අත්තේ ! ඇයි ලොකු අත්තා නිකං බලාගෙන ඉන්නේ ?

**රංබරණා** : දරුවා කැමති නැත්තං ඇයි උඹට වද කරන්නේ ?

**සභාපති** : දැන් ඉතින් මට මැදිහත් නොවී බෑ. ගුරුන්නාන්සේ කරුණා කරලා අපේ වැඩේ කර ගන්න ඉඩ දෙන්න.

**ඔකනල්** : මේකට නං දැඩි ක්‍රියාමාර්ග ගන්ට සිද්ධ වෙනවා .........

**ගමරාළ** : දැඩි ? දැඩි නෙවෙයි හැඩි දැඩි ක්‍රියාමාර්ගයක් ගන්ටයි සිද්ධ වෙන්නේ ......! දෙමව්පියන් කැමතියි ළමයව රට යවන්ට ...... කොම්පැණිය විශාල මුදලක් වෙන්කරලා තියෙනවා ළමයගේ දියුණුවට. දැනටමත් අත්තිකාරං ගෙවලා තියෙනවා දෙමව්පියන්ට. මේ කොහෙවත් යන පරාණකාරයෙක් මළ බෙරේ අඬවනවා.

**රංබරණා** : ඔය කියන සේරම ඇත්ත වෙන්න පුලුවන්. ඒත් දරුවා කැමති මගේ ළඟ ඉන්ටයි.

**සභාපති** : නමුත් දෙමව්පියෝ කැමති රට යවන්ට.

**ඔකනල්** : මෙතනත් දරු ප්‍රශ්නය රඟපාන්ට ද හදන්නේ ?

**මහේෂිකා** : තමුන් කැමති දෙයක් දරුවන් වෙනුවෙන් කරන්ට දෙමව්පියන්ට අයිතිය තියෙනවා.

**රංබරණා** : මමයි දරුවා හැදුවෙ. දරුවා කැමති මගේ ආශ්‍රයට.

**මහේෂිකා** : මමයි දරුවා වැදුවේ. දරුවා කැමති වෙන්න ඕනෑ අපි කියන දෙයක් කරන්ට.

(නිහඬතාවයකි. රංබරණා සෙමින් හේතුව වැළඳ ගනියි)

(i) මේ අවස්ථාවේ දී නළු-නිළියෝ කී දෙනෙක් වේදිකාවේ සිටිත් ද? (ලකුණු 01 යි)

(ii) දරුවා අකමැති වී ඇති කරුණ කුමක් ද? (ලකුණු 01 යි)

(iii) හේතු රංබරණාගෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

(iv) මෙහි දරුවා තම රැකවරණය හා ආදරය අපේක්ෂා කරන්නේ කවුරුන්ගෙන් ද? (ලකුණු 01 යි)

(v) කොම්පැණි යන ඉංග්‍රීසි වචනයේ සිංහල තේරුම කුමක් ද? (ලකුණු 01 යි)

(vi) මෙම සංවාදයට අනුව දැඩි මානසික ආතතියට පත් චරිත **දෙක** නම් කරන්න. (ලකුණු 01 යි)

(vii) මෙහි ඇති රංග විධානය ලියා දක්වන්න. (ලකුණු 01 යි)

(viii) හැදූ දරුවා සහ වැදූ දරුවා මූලික කරගත් කතාව අඩංගු වන්නේ කවර ජාතක කතාවේ ද? (ලකුණු 01 යි)

(ix) "යමක් කරවා ගැනීමට නියමිත ගාස්තුවෙන් කොටසක් කලින් ගෙවීම" මෙහි දක්වනු ලැබ ඇත්තේ කෙසේ ද? (ලකුණු 01 යි)

(x) ලාංකේය පවුල් සංස්ථාව වර්තමානයේ වඩාත් ව්‍යසනකාරී බවට මුහුණ දී ඇති ගැටලුවක් මෙහි කියැවේ. එය කුමක් ද? (ලකුණු 02 යි)

**2.** "පුතු සෙනේ මස් නහර හම සිඳ
ඇට සොයා ගොස් ඇට තුළට වැද
ඇට මිදුළු මත රඳා සිට දුක් දෙයි නිබන්දා"

(i) උක්ත ගී කණ්ඩය හිමි නාට්‍යය කුමක් ද? (ලකුණු 02 යි)

(ii) එම නාට්‍යයේ ප්‍රධාන චරිත **තුන** කවරේ ද? (ලකුණු 04 යි)

(iii) මෙම නාට්‍යයේ රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි)

[ හයවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

3. (i) නාට්‍ය පිටපත යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ii) නාට්‍ය පිටපත හා නිෂ්පාදන පිටපත අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iii) පෙළ රංගයක් බවට පත් කිරීමේ පියවර පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) වඩාත් ජනප්‍රිය නූර්ති රචකයා වූයේ කවරෙක් ද? (ලකුණු 02 යි)
(ii) ඔහුගේ කෘති **තුනක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) නූර්තිහි රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි)

5. (i) නාට්‍යයක ගැටුම යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ii) නාට්‍යයේ දක්නට ලැබෙන විවිධ ගැටුම් ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) ගැටුම් අවස්ථාවක් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

6. (i) ලංකාවේ බිහි වූ නාට්‍යධර්මී හා ලෝකධර්මී නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) එම නාට්‍ය ඉදිරිපත් කළ රචකයන් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) නාට්‍යධර්මී හා ලෝකධර්මී රංග ශෛලි **දෙක** වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකි ය.

"එක්තරා වෙළෙඳකුට සිටි 16 හැවිරිදි එක ම පුත්‍රයා පියාගෙන් මුදල් ද සොරාගෙන ගෙදරින් පිට වී ගොස් නාස්තිකාර ජීවිතයක් ගත කොට කෙටි කාලයක දී එදාවේල සොයාගත නොහැකි දිළිඳකු බවට පත් වේ. පුතු නැති සොවින් පසු වූ පියා එගම හැර ගොස් වෙනත් ගමකට ගොස් ස්වකීය ව්‍යාපාරය දියුණු කරගෙන ධනකුවේරයකු බවට පත් ව දැසි-දසුන් පිරිවරා විසල් මන්දිරයක ජීවත් වෙයි. මේ අතර 40 වසරකට පසු වැරහැලි හැඳගත් පුත්‍රයා රැකියාවක් සොයා පියාගේ වත්තට ඇතුළු වේ. සිය පියා දුටු ඔහු, හඳුනාගත නොහැකි ව බියෙන් පලා යන්නට තැත් කරයි. එහෙත් පියා දුර සිට ම සිය පුතු හඳුනාගනී. ............

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)
(ii) සංවාද හා රංග විධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka